8 වසර - නර්තනය.

• **විධික්‍රම අනුගමනය කරමින් බෙර වාදනය.**

දේශීය බෙර වාදන හා දවුල් වාදන අභ්‍යාසයට පොදුවූ මූලික ධ්වනි 4 කි. ඒවා බීජාක්ෂර යනුවෙන් හැඳින්වේ. බීජාක්ෂර යනු තත්, ජිත්, තොං, නං හෙවත් තත්, දිත්, තොං, නං ය. බීජාක්ෂර පදනම් කරගෙන උපදින අනෙකුත් අක්ෂර හැඳින්වෙන්නේ ගර්භාක්ෂර නමිනි.

උඩරට බෙර වාදනයේ බීජාක්ෂර තත්, ජිත්, තොං, නං යනුවෙන් හැඳින්වෙන අතර පහතරට බෙර වාදනයේ දී බීජාක්ෂර තත්, දිත්, තොං, නං යනුවෙන් හැඳින් වේ. මෙහිදී උඩරට බෙර වාදනයේ "ජිත්" යන බීජාක්ෂරය "දිත්" යනුවෙන් පහතරට බෙර වාදනයේදී වෙනස්වේ. තවද සබරගමු සම්ප්‍රදායේ දවුල් වාදනයේ සතර බීජාක්ෂර හඳුන්වන්නේ තත්, ජිත්, තොං, නං යනුවෙනි. මෙය උඩරට බෙර වාදනයේ සතර බීජාක්ෂර වලට සමානය.

• **උඩරට බෙර වාදනයේ දී සතර බීජාක්ෂර වාදනය වන අයුරු.**

"තත්" - ගැටබෙරයේ වම් ඇස මැදට ශබ්දය පුපුරා යන ලෙස ඇඟිලි වලින් සහ අත්ලේ ඇඟිලි ආශ්‍රිත කොටසින් තැලීමෙන් මෙම අක්ෂරය උපදියි.

"ජිත්" - මෙම අක්ෂරය දකුණු බෙර ඇසින් උපදවන්නකි. බෙර ගැටිය අසලට ඇඟිලි මුල්කොට තෙරෙන තැලීමක් සමඟ හඬ විසිරී යා නොදී ඇඟිලි බෙර ඇසට බර කිරීමෙන් මෙම හඬ උපදවා ගත හැකිය.

"තොං" - වම් බෙර ඇසේ ගැටිය අසල තැළුම් හමට කිට්ටුවෙන් උපදවා ගන්නා ප්‍රධාන අක්ෂරය "තොං" වේ. බෙර ගැටිය අසලට ඇඟිලි අග සහ මැද බර වන සේ තැලීමෙන් මෙකී අක්ෂරය උපදවා ගත හැකිය.

"නං" - මෙය ඇඟිලි මූලික වන සේ දකුණු බෙර ඇසේ ගැටිය අසලට ඇඟිලි අගින් වැදුනු පසු අත බිමකට යොමට සැලැස්වීමෙන් "නං" අක්ෂරය උපදවා ගැනේ.

• පැවරුම: - මෙම සටහන නර්තන විෂයට අදාල පොතෙහි සටහන් කරගන්න. අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

* සමාන හා දක්වන සතර බීජාක්ෂර අයත් සම්ප්‍රදායන් මොනවාද?.

* සම්ප්‍රදායන් තුනට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩ වල රූප සටහන් ඇඳ, ගැටබෙරයෙහි බීජාක්ෂර උපදවන ස්ථාන ලකුණු කරන්න.